**<u>පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2026.04.07 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව.</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම 2026 අප්‍රේල් මස 07 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.නිර්මික දීපාල් අබේවර්ධන මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.චන්ද්‍රලාල් මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | එම්.සුලාරි සඳරේඛා මාකාවිට මැතිතුමිය. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමා. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ටී. ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | එම්.ප්‍රදීපා ඉදුමිණී කුලරත්න මැතිතුමිය. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | වෙරංජා කාමනී විජේරත්න මැතිතුමිය. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඩබ්.මොහාන් මංජුල මැතිතුමා |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.තිෂෝක් මැතිතුමා |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.පී.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ජෙගන් මෝහන් මැතිතුමා |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | එච්.ඥානලතා හපුතන්ත්‍රී මැතිතුමිය |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමිය |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සරත් උෂාන් මහානාම මැතිතුමා |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩබ්.එම්. ශ්‍රියානි වීරසේකර මැතිතුමිය |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු විපක්ෂ නායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01.2026.03.11 මහා සභා වාර්තාව සභා සම්මත කිරීම.**

යෝජනා අංක 04 යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා අදහස් ඉදිරිපත් කිරීමේදී ආදාහනාගාර භූමියේ පෞද්ගලික උත්සව ශාලාවක් ඉදිකළහොත් අඩු වියදමට ජනතාවට සහනය ලබා දිය හැකි බවත්ය යන ප්‍රකාශයෙහි **පෞද්ගලික උත්සව ශාවක්** ලෙස සඳහන් වීම **ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන අවමංගල්‍යාය උත්සව ශාලාවක්** යනුවෙන් වෙනස් විය යුතු බවය.

ඉහත සංශෝධනයන් වලට යටත්ව 2026.03.11 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

02. **සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන- නැත**

**03.සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.**

හදිසි ශල්‍යාය කර්මයකට ලක්වීම හේතුවෙන් වෛද්‍ය හේතුන් මත සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමාගේ හා වෛද්‍ය හේතුන් මත ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා , ආර්.ධනේශ් කුමරන් මැතිතුමාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

වෛද්‍ය හේතුන් මත සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මැතිතුමාගේ ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා හා ජී.ඉන්දික කුමාර මැතිතුමාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය

සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.තිෂෝක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**04.ගරු සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම- නැත**

**05.යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න -නැත**

**06.යථා පරිදී කල් දී ඇති යෝජනා**

I. **<u>ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනා.</u>**

01. පවතින ඉන්ධන ගැටළුව හා අප ආයතනයේ මූල්‍යමය තත්වය මත බැකෝ යන්ත්‍රය පොදු වැඩ සඳහා ලබා දීමේදී ඒ සඳහා වැය වන ඉන්ධන ඉල්ලුම්කරු විසින් ලබා දිය යුතු යැයි යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 01**

පවතින ඉන්ධන ගැටලුව හා අප ආයතනයේ මූල්‍යමය තත්වය මත බැකෝ යන්ත්‍රය පොදු වැඩ සඳහා ලබා දීමේදී ඒ සඳහා වැය වන ඉන්ධන ඉල්ලුම්කරු විසින් ලබා දිය යුතු බව ඒකමතිකව සහා සම්මත විය

02.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් ලෙස සභාවට කිහිප දෙනෙකු බඳවා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 02**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් බඳවා ගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

03.සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2316/20 සහ 2023 ජනවාරි මස 24 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙළ කිරීම හා නාමලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ 2025.01.16 වන දින පවත්වනු ලැබූ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහය වීමේ කමිටුවේ අංක 13 දරණ තීරණය අනුව 2025.03.01 දින ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ ඇති නිවේදනයේ උපලේඛනයේ ඇතුලත් නාම ලේඛනයේ දැක්වෙන ඇතුළත් පාරවල් සහ පටු මාවත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු පාරවල් සහ පටු මාවත් වශයෙන් තහවුරු කළ යුතු බවට යෝජනා කරමි

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 03**

සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2316/20 සහ 2023 ජනවාරි මස 24 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙළ කිරීම හා නාමලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ 2025.01.16 වන දින පවත්වනු ලැබූ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහය වීමේ කමිටුවේ අංක 13 දරණ තීරණය අනුව 2025.03.01 දින ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ ඇති නිවේදනයේ උපලේඛනයේ ඇතුලත් නාම ලේඛනයේ දැක්වෙන ඇතුළත් පාරවල් සහ පටු මාවත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු පාරවල් සහ පටු මාවත් වශයෙන් තහවුරු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

04.නිරිතදිග මෝසම් පෙරසූදානම 2026 මැයෙන් නිරිත දිග මෝසම සක්‍රීය විය හැකි බැවින් ආපදාවට ලක් විය හැකි ප්‍රදේශ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ආපදාවට පෙර සූදානම් වීම සඳහා ආපදා කළමනාකරණ කටයුතු වලට අදාළව බාහිර පාර්ශවයන්ගෙන් යුත් කමිටුවක් පත් කිරීම සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

හදිසි අවස්ථාවකදී ආයතනයක් ලෙස ආපදාවට ආයතනයක් ලෙස මැදිහත් වන්නේ වන්නේ කෙසේද?බඩු භාණ්ඩ මොනවාද?මානව සම්පත සුදුසු පරිදි පුහුණු කර තබා ගන්නේ කෙසේද?එවැනි හදිසි අවස්ථාවක මෙම තෝරාපත් කරගන්නා කණ්ඩායම සඳහා විශේෂ පුහුණුවක් ලබා දීම භාණ්ඩ රැස්කර තබා ගැනීමට අවශ්‍යතාවයක් පවතින බැවින් ආයතනයක් ලෙස ආපදා ඒකකයක් නිර්මාණය කිරීමටත්,මූලික වශයෙන් කමිටුවක් පත් කිරීමටත් එම කමිටු නිර්දේශ අනුව අනෙකුත් පහසුකම් සළසා ගැනීම බලාපොරොත්තු වන බවත් ඒ අනුව කමිටුවක් පත් කරගන්නා ලෙස බවට ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා ඉල්ලා සිටින ලදි.

පැල්මඩුල්ල බල ප්‍රදේශය ආපදාවන්ට නාය යාම් වලට ලක්වන ප්‍රදේශ කිහිපයක් ඇති හෙයින් මෙම යෝජනාව ඉතාමත් සුදුසු යෝජනාවක් බවත්,මෙම නාය යාම් ප්‍රදේශ හඳුනා නොගත් ප්‍රදේශ පවතින බවත්,අවදානම් සහිත ස්ථාන හඳුනාගත යුතු බවත්,මේ සම්බන්ධයෙන් නිසි සැලැස්මක් සකස් කළ යුත් බවත්,එවිට අවදානම අවම කළ ගත හැකි බවත්,විධිමත් ආපදා කළමණාකරණ කමිටුවක් සකස් කිරීමටත් ගමින් ගම ශාඛා කමිටු සකස් කිරීමටත්, අවශ්‍ය පුහුණුවීම් උපකරණ ලබා දීමටත්,රජයේ ආයතන වලින් උදව් උපකාර, උපදෙස් රැගෙන පැල්මඩුල්ල බල ප්‍රදේශයේ නාය යාම් ,ගංවතුර ආදී ආපදා වලදී ජනතාව සුරක්ෂිත කරන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරමු යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

මෙවැනි කාලීන වැදගත් යෝජනාවක් ගෙන ඒම සම්බන්ධයෙන් ස්තූතිය පුද කරන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසන ලදි.

පක්ෂ පාට භේදයකින් තොරව සියලු දෙනා කටයුතු කළ යුතු බවත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව හා පැල්මඩුල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය එකතු වී විධිමත් සැලැස්මකට අනුව කටයුතු කළ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසන ලදි.

පෙ.ව. 10.30 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමිය සභාවට පැමිණෙන ලදි.

ඒ අනුව මූලික කමිටුව ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ප්‍රාදේශීය ලේකම්, පරිපාලන ග්‍රාම නිලධාරී,ආපදා කළමණාකරණ නිලධාරී වරුන් සහ කහවත්ත හා පැල්මඩුල්ල පොලීසිය මහජන සම්බන්ධතා නිලධාරී තුමන් ප්‍රාදේශීය සභාවේ නිළධාරීන්ගෙන් ලේකම්තුමා ,ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී, ආපදා විෂය නිළධාරී,කේ.ජේ.උපනන්ද මයා,ටී.ඩී.කේ.පෙරේරා මයා ඇතුළත් කර ගත යුතු බවට ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

පෙ.ව. 10.30 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා සභාවට පැමිණෙන ලදි.

පෙ.ව. 10.30 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා සභාවෙන් පිටවන ලදි.

ප්‍රා.ස.ම. බී.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා, ප්‍රා.ස.ම. එච්.එම්.එස්.යූ.මහානාම මැතිතුමා, ප්‍රා.ස.ම. කේ.ඩී.ආර්.සී.පියරත්න මැතිතුමා, ප්‍රා.ස.ම.ඩබ්.අයි.යූ.කේ.ගුණවර්ධන මැතිතුමා, ප්‍රා.ස.ම.එස්.ඒ.එස්.එස්.අමරසේකර මැතිතුමා, ප්‍රා.ස.ම.ඩී.එම්.එම්.දසනායක මැතිතුමා මෙම කමිටුවට ඇතුළත් කළ යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා යෝජනා කළ අතර ප්‍රා.ස.ම.මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා යෝජනා කරන ලදි.

ප්‍රා.ස.ම. ඒ.වී.එන්.ඩී.අබේවර්ධන මැතිතුමා, ප්‍රා.ස.ම.කේ.ජී.සී.ජයරත්න මැතිතුමා, ප්‍රා.ස.ම.ඒ.එෆ්.ජේ.සේනාරත්න මැතිතුමා, ප්‍රා.ස.ම. ඩබ්.එම්.එස්.වීරසේකර මැතිතුමිය, ප්‍රා.ස.ම. ඩබ්.ඒ.ජී.පුෂ්පකුමාර මැතිතුමා, ප්‍රා.ස.ම. ටී.කේ.එස්.සිරිශාන්ත මැතිතුමා, ප්‍රා.ස.ම. ඒ.එම්.ඒ.අයි.එස්.අලගියවන්න මැතිතුමා, ප්‍රා.ස.ම.ආර්.තිෂෝක් මැතිතුමා, ප්‍රා.ස.ම.ආර්.එල්.අයි.ජී.ලියනගේ මැතිතුමා සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා යෝජනා කළ අතර ප්‍රා.ස.ම කේ සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා යෝජනා කරන ලදි.

පෙර ගංවතුර සමයේ ගසාගෙන ආ කුණු ගන්කන්ද පාසල අසළ පාලම යට ඇති බවත්,නැවත වැසි සමයේදී මෙම කුණු කසළ ඉවත් නොකළහොත් නැවත ගංවතුර තත්වයකට මුහුණ පෑ හැකි බැවින් කඩිනමින් මෙම කුණු ඉවත් කර දෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.සුලාරි සඳරේඛා මැතිතුමිය ඉල්ලා සිටින ලදි.

මෙම යෝජනාව ඉදිරිපත් කරන ලද්දේ පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් රාජපක්ෂ මැතිතුමාගේ අදහසකට අනුව බව ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

<u>**තීරණ අංක 04**</u>

ආපදාවට පෙර සූදානම් වීම සඳහා ආපදා කළමනාකරණ කටයුතු සඳහා මූලික වශයෙන් පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත ආපදා කළමනාකරණ කමිටුවක් පත් කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

| | |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - ප්‍රාදේශීය ලේකම් |
| | - පරිපාලන ග්‍රාම නිලධාරී |
| | - ආපදා කළමණාකරණ නිලධාරී |
| කහවත්ත හා පැල්මඩුල්ල පොලීසිය | - මහජන සම්බන්ධතා නිලධාරී |
| ප්‍රාදේශීය සභාව | - ලේකම් |
| | -ප්‍රා.ස.ම.බී.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා |
| | - ප්‍රා.ස.ම.එච්.එම්.එස්.යූ.මහානාම මැතිතුමා |
| | - ප්‍රා.ස.ම.කේ.ඩී.ආර්.සී.පියරත්න මැතිතුමා |
| | -ප්‍රා.ස.ම.ඩබ්.අයි.යූ.කේ.ගුණවර්ධන මැතිතුමා |
| | -ප්‍රා.ස.ම.එස්.ඒ.එස්.එස්.අමරසේකර මැතිතුමා |
| | - ප්‍රා.ස.ම.මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා |
| | - ප්‍රා.ස.ම.ඩී.එම්.එම්.දසනායක මැතිතුමා. |
| | - ප්‍රා.ස.ම.ඒ.වී.එන්.ඩී.අබේවර්ධන මැතිතුමා |
| | - ප්‍රා.ස.ම.කේ.ජී.සී.ජයරත්න මැතිතුමා |
| | - ප්‍රා.ස.ම.ඒ.එෆ්.ජේ.සේනාරත්න මැතිතුමා |
| | - ප්‍රා.ස.ම.ඩබ්.එම්.එස්.වීරසේකර මැතිතුමිය |
| | - ප්‍රා.ස.ම.ඩබ්.ඒ.ජී.පුෂ්පකුමාර මැතිතුමා |
| | - ප්‍රා.ස.ම.ටී.කේ.එස්.සිරිශාන්ත මැතිතුමා |
| | - ප්‍රා.ස.ම.ඒ.එම්.ඒ.අයි.එස්.අලගියවන්න මැතිතුමා |
| | - ප්‍රා.ස.ම.ආර්.තිෂෝක් මැතිතුමා |
| | - ප්‍රා.ස.ම.ආර්.එල්.අයි.ජී.ලියනගේ මැතිතුමා |
| | - ප්‍රා.ස.ම.කේ.එස්.ප්‍රේමකුමාර මැතිතුමා |
| | - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී |
| | - ආපදා විෂය නිළධාරී |
| | - කේ.ජේ.උපනන්ද මයා |
| | -ටී.ඩී.කේ.පෙරේරා මයා |

05.රාජ්‍ය පරිපාලන ,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් පළාත් පාලන ආයතන වල කුඩා පාලම් වැඩිදියුණු කිරීමේ තිරසාර ව්‍යාපෘතිය -2026 සංරවකය යටතේ පහත ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කැඳවා ඇත.

- කුට්ටපිටිය වත්තෙ පංගුව පාලම - ඇ.මු.රු.19,320,000.00

මෙම පාලම ඉදිකිරීම සම්බන්ධයෙන් සහා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>**තීරණ අංක 05**</u>

රාජ්‍ය පරිපාලන ,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් පළාත් පාලන ආයතන වල කුඩා පාලම් වැඩිදියුණු කිරීමේ තිරසාර ව්‍යාපෘතිය -2026 සංරවකය යටතේ පහත ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කැඳවා ඇත.

- කුට්ටපිටිය වත්තෙ පංගුව පාලම - ඇ.මු.රු.19,320,000.00

ඉදිරිපත් කළද වෙළඳපළ මිල ගණන් වෙනස් වීම හේතුවෙන් රු.20,650,000.00ක සංශෝධිත ඇස්තමේන්තුවට අනුව මෙම පාලම ඉදිකිරීම සම්බන්ධයෙන් සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

06.2025 වර්ෂයේ ප්‍රධාන අමාත්‍යාංශ අරමුදලින් ඉටු කරන ලද පහත ව්‍යාපෘති වලට අදාළ බිල්පත වෙනුවෙන් චෙක්පත් ලැබුණි.එම චෙක්පත් වලට අදාළ මුදල් කොන්ත්‍රාත්කරුවන් වෙත ආවරණ අනුමැතිය යටතේ මුදල් ගෙවන ලදි.එම ගෙවීම් සහා අනුමැතියට කාරුණිකව ඉදිරිපත් කරමි.

- කෙටේතැන්න කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම -රු.1,045,989.85 (කොන්ත්‍රාත්කරු ,රන්බිම ගොවි සංවිධානය,පනාවැන්න,කහවත්ත)
- බණ්ඩාරවත්ත දෙනවක යා කරන මාර්ගයේ ආරොන්සිංඥෝ මහතාගේ නිවස අසළ සිට දෙනවත පාතකඩ මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය. - රු.1,262,136.23 (කොන්ත්‍රාත්කරු,දෙනවක එක්සත් අවමංගාධාර සමිතිය,දෙනවක බෝධිය පරිශ්‍රය, දෙනවක,ගනේගම)
- පළාත් මාර්ග සංවර්ධන ග්‍රාමීය යටිතල පහසුකම් සංවරක ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාශය මඟින් ප්‍රතිපාදන අනුමත වූ ගෝණකුඹුර හංදියේ සිට ඇතුගල දක්වා මාර්ගය ඉදි කිරීම - රු.1,708,498,89 (කොන්ත්‍රාත්කරු ,ගෝණකුඹුර සහෘද සංසදය)

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>**තීරණ අංක 06**</u>

2025 වර්ෂයේ ප්‍රධාන අමාත්‍යාංශ අරමුදලින් ඉටු කරන ලද පහත ව්‍යාපෘති සඳහා මුදල් කොන්ත්‍රාත්කරුවන් වෙත ආවරණ අනුමැතිය යටතේ මුදල් ගෙවන ලදි එම ගෙවීම් අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

- කෙටේතැන්න කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම -රු.1,045,989.85 (කොන්ත්‍රාත්කරු ,රන්බිම ගොවි සංවිධානය,පනාවැන්න,කහවත්ත)
- බණ්ඩාරවත්ත දෙනවක යා කරන මාර්ගයේ ආරොන්සිංඥෝ මහතාගේ නිවස අසළ සිට දෙනවත පාතකඩ මාර්ගයේ ඉතිරි

කොටස සංවර්ධනය. - රු.1,262,136.23 (කොන්ත්‍රාත්කරු,දෙනවක එක්සත් අවමංගල්‍යාධාර සමිතිය,දෙනවක බෝධිය පරිශ්‍රය, දෙනවක,ගනේගම)

- පළාත් මාර්ග සංවර්ධන ග්‍රාමීය යටිතල පහසුකම් සංවරක ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මගින් ප්‍රතිපාදන අනුමත වූ ගෝණකුඹුර හංදියේ සිට ඇතුගල දක්වා මාර්ගය ඉදි කිරීම - රු.1,708,498,89 (කොන්ත්‍රාත්කරු ,ගෝණකුඹුර සහෘද සංසදය)

07.පොදු වෙළඳපළ අංක 14 දරණ මාළු කඩ කාමරය 2026 වර්ෂයට බදු දීම සම්බන්ධයෙන් 2026.03.13 වන දින ප්‍රසම්පාදන කමිටුව රැස්වී තීරණයක් ලබා ගත් අතර එම රැස්වීම් වාර්තාව සුදුසු තීරණයක් ලබා ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

පසුගිය එනම් 2026.02.11 සභා තීරණය මගින් මාළු කඩය සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට ප්‍රසම්පාදන කමිටුවට යොමු කළ බවත්,එහිදී 2026.03.13 වන දින ප.ව.2.00ට සාමාජිකයින් 06 දෙනෙකුගෙන් සමන්විත ප්‍රසම්පාදන කමිටුව රැස්වූ බවත්,ඒ අනුව ලැබුණ මිළ ගණන් නැවත සළකා බලා නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කළ බවත්,පොඩි අසාමාන්‍ය තත්වයක් පෙන්නුම් කරන බැවින් මුල් ගැනුම්කරු ප්‍රතික්ෂේප කර ඇති බවත්,අවසන් ගැනුම්කරු වන රු.471,999.00 මුදලක් ඉදිරිපත් කර ඇති බවත්ය,කෙසේ හෝ අවසානයේ රු.471,999.00 මුදලක් ඉදිරිපත් කළ ගැණුම්කරුවාට තල්ලු වී යන බවක් පෙන්නුම් කරන බවත්,පැරණි ගොනු පරීක්ෂා කිරීමේදී අතීතයේදී සිදු වී ඇත්තේ එයම බව පැහැදිලි වූ බවත්ය. එනිසා ප්‍රසම්පාදන සංග්‍රහයේ 1.5.2. ඡේදයේ (ඇ)දූස්සන්ධානීය ක්‍රියාව යටතේ මෙම පුද්ගලයන් දූස්සන්ධානගතවීමක් සිදු වී ඇති බවට පැහැදිලි වන බවත්ය එනිසා මෙය දූස්සන්ධානීය ක්‍රියාවක් බව නිරීක්ෂණය වූ බවය.සභාවේ දේපළ වලින් සත්‍ය හා සාධාරණ උපරිම මුදලක් ආදායම ලෙස ලබා ගැනීමේ අප සියලු දෙනාගේ වගකීම බවත්,එනිසා සියලු කරුණු සළකා බලා ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම දූස්සන්ධානීය ක්‍රියාව යටතේ ලංසු පත් ප්‍රතික්ෂේප කිරීමටත්, මීට පෙර එනම් 2026.02.11 වන දින පැවති මාසික මහා සභා රැස්වීම් තීරණ අංක 13 මගින් ලබා ගන්නා ලද තීරණය එනම් පොදු වෙළඳපළ අංක 14 දරණ කඩ කාමරය නැවත ටෙන්ඩර් කිරීම සුදුසු බව යන මහා සභා තීරණය එලෙසින්ම ක්‍රියාත්මක කිරීම සුදුසු බව 2026.03.13 දින ප.ව.2.00ට රැස්වූ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා ප්‍රසම්පාදන මණ්ඩලය විසින් ඒකමතිකව තීරණය කළ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා පවසන ලදි.

<u>**තීරණ අංක 07**</u>

2026.03.13 වන දින ප.ව.2.00ට රැස්වී ප්‍රසම්පාදන කමිටුව විසින් ලබා දුන් නිර්දේශ අනුව පොදු වෙළඳපළ අංක 14 දරණ මාළු කඩ කාමරය 2026 වර්ෂයට බදු දීම සඳහා නැවත ටෙන්ඩර් කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

08.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් කහවත්ත පොදු වැසිකිළිය සහා අරමුදලින් අලුත්වැඩියා කර ජලය හා විදුලිය ලබා දී ටෙන්ඩර් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>**තීරණ අංක 08**</u>

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් කහවත්ත පොදු වැසිකිළිය සහා අරමුදලින් අලුත්වැඩියා කර ජලය හා විදුලිය ලබා දී ටෙන්ඩර් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

09.සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ CM/DE/16/EST/2026 හා 2026.03.20 දිනැති ලිපිය (පළාත් පාලන මාර්ග-රත්නපුර දිස්ත්‍රික්කය ඇස්තමේන්තු කැඳවීම 2026)අනුව පහත කර්මාන්ත 03 සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට නියමිත බව මාවෙත දන්වා ඇත.

I. මුල්ලකන්ද අම්පිටිය මාර්ගය කොන්ක්‍රීට් කිරීම - වැලිමළුව ග්‍රාම නිලධාරී වසම- රු.මිලියන 2.00
II. සමනළගම මාර්ගය සංවර්ධනය කිරීම - පාතකඩ ග්‍රාම නිලධාරී වසම- රු.මිලියන 1.50
III. ඉහළ බෝපිටිය අක්කර 10 මාර්ගය කොන්ක්‍රීට් කිරීම - ඉහළ බෝපිටිය ග්‍රාම නිලධාරී වසම-රු.මිලියන1.00

එම සංවර්ධන යෝජනා අනුව සකස් කල ඇස්තමේන්තු සභා අනුමැතියට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>**තීරණ අංක 09**</u>

පහත සඳහන් ව්‍යාපෘති සඳහා සකස් කළ ඇස්තමේන්තු අනුමත කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

I. මුල්ලකන්ද අම්පිටිය මාර්ගය කොන්ක්‍රීට් කිරීම - වැලිමළුව ග්‍රාම නිලධාරී වසම- රු.මිලියන 2.00
II. සමනළගම මාර්ගය සංවර්ධනය කිරීම - පාතකඩ ග්‍රාම නිලධාරී වසම- රු.මිලියන 1.50
III. ඉහළ බෝපිටිය අක්කර 10 මාර්ගය කොන්ක්‍රීට් කිරීම - ඉහළ බෝපිටිය ග්‍රාම නිලධාරී වසම- රු.මිලියන1.00

10. සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ CM/DE/05/PSDG/2026 හා 2026.03.20 දැනැති ලිපිය අනුව (පළාත් පාලන සේවා පොදු පහසුකම්)ඇස්තමේන්තු කැඳවීම 2026 (රත්නපුර දිස්ත්‍රික්කය)පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාර්ග නඩත්තු කටයුතු සඳහා පෙර මිශ්‍රණ අංගනයක්(PREMIX YARD) සකස් කිරීමට ප්‍රතිපාදන වෙන් කිරීමට නියමිත බව මා වෙත දන්වා ඇත.(රු.මිලියන 1.80 කෙටෙතැන්න කසළ මධ්‍යස්ථානය)එම යෝජනාව අනුව Construction of ketethanna premix yard ) රු.මිලියන 1.80 ක ඇස්තමේන්තුව සභා අනුමැතියට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

පසුගිය අයවැයෙන් මෙම සංවර්ධනය සඳහා මිලියන 04ක් වෙන් කර ඇති බවත්,ලේකම්තුමා මගින් තවත් රු.මි.1.8ක ප්‍රතිපාදනයක් සභාවට ලබා ගෙන ඇති බවත්,ඒ අනුව රු.ලක්ෂ 58ක මුලික ප්‍රාග්ධනයකින් PREMIX YARD එකට ආරම්භයක් ලබා ගැනීමටත්,සභාව යටතේ නඩත්තු වන මෙම සේවාව මගින් මාර්ග වල පොඩි පොඩි නඩත්තු සිදු කිරීමට හැකියාවක් පවතින බවය.කසළ මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කළ බවත්,කසළ අංගනයෙහි තෝරාගෙන ඇති ස්ථානයෙහි ස්ථාපිත කිරීමට හැකියාවක් පවතීද යන්න සොයා බැලීමක් සිදු කළ යුතු බව ගරු ප්‍රාදේශිය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ මෙම කාර්යය සඳහා ඉඩ ප්‍රමාණවත්ද,නොමැති නම් තවත් ඉඩම් කොටස් පවරා ගැනීමට හැකායාවක් පවතීද යන්න සොයා බැලීමක් කළ යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසන ලදි.

PREMIX YARD එක ආදාහනාගාර භූමියෙහි කොටසක සිදු කිරීම සුදුසු බවත්,මෙම ස්ථානයේ මෙම සංවර්ධනය සිදු කළ හොත් එම ස්ථානයේ කැමරා සවි කිරීමට ,ද්‍රව්‍ය ප්‍රවාහනයට,ද්‍රව්‍ය සම්බන්ධව වගකීමක් හා ආරක්ෂිත බවත්, නිරන්තරයෙන් නිරීක්ෂණය කළ හැකි බවත්,කසල අංගනයට වඩා ආදාහනාගාර භූමිය මෙම සංවර්ධනය සිදු කිරීමට සුදුසුම ස්ථානය බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

ආදාහනාගාර භූමියෙහි විශාල ඉඩක් පවතින බවත් පෙර පැවති පෙර නිමි තාර මිශ්‍රණ අංගනය මෙම භූමියෙහි පිහිටා තිබූ බවත්,මෙම ඉඩම කැළයට ගොස් ඇති බවත්,ඉදිකිරීමක් බලාපොරොත්තු වන ස්ථානයට හා මිනි භූමදානයට ඉඩ ඇර ඉතිරිකොටසෙහි පෙර නිමි තාර මිශ්‍රණ අංගනයක් සැකසීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා පවසන ලදි.

ආදාහනාගාර භූමියෙහි සුසාන භූමි කොටස අඩි 3-4ක බැම්මක් ඉදි කර පස් පුරවා භාවිතයට ගැනිම තුලින් පෙර නිමි තාර මිශ්‍රණ අංගනය හා අවමංගල්‍යය උත්සව ශාලාවක් ඉදිකිරීමට ඉඩ ඉතුරු වන බවත්,පස් පුරවා බැම්මක් ඉදිකර සියලු ඉදිකිරීම් සිදු කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා පවසන ලදි.

**<u>තීරණ අංක 10</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාර්ග නඩත්තු කටයුතු සඳහා පෙර මිශ්‍රණ අංගනයක්(PREMIX YARD) සකස් කිරීමට සකස් කළ රු.මිලියන 1.80 ක ඇස්තමේන්තුව අනුමත කිරීමටත්, පැරණි පෙර මිශ්‍රණ අංගනය පිහිටි ස්ථානයේ( ගල්ලෙපිට ආදාහනාගාර ඉඩමෙහි) පෙර මිශ්‍රණ අංගනයක්(PREMIX YARD) සකස් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

11. සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ CM/DE/08/26/ESS /01 හා 2026.03.02 ලිපිය අනුව (වතු යටිතල පහසුකම් සංවර්ධනය හා සංරචකය -ඇස්තමේන්තු කැඳවීම 2026)පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට පහත කර්මාන්ත 2 සඳහා )ප්‍රතිපාදන වෙන් කිරීමට නියමිත බව දන්වා ඇත.

I. Concreting of road church to shop in no.06 division at panawenna - රු. මිලියන 1.3
II. Concreting of road from nataraj to kanavinna road pelmadulla - රු. මිලියන 1.3

ඉහත යෝජනා සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු සහා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 11</u>**

පහත සඳහන් ව්‍යාපෘති සඳහා සකස් කළ ඇස්තමේන්තු අනුමත කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

I. Concreting of road church to shop in no.06 division at panawenna - රු. මිලියන 1.3
II. Concreting of road from nataraj to kanavinna road pelmadulla - රු. මිලියන 1.3

12.ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ PLDS/PLD/09/ ග්‍රාමීය පාලම්/MAIN/2026 හා 2026.03.24 දිනැති ලිපිය මඟින් පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංවර්ධනය කිරීමට නියමිත පහත සඳහන් ග්‍රාමීය පාලම් සංවර්ධනය කිරීම සඳහා එකඟතාවය හා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

I. දේවාලෙගම - කඩදොරකන්ද මාර්ගයේ නැදුන් දොළ හරහා පාලමක් සෑදීම
II. දේවාලෙගම - ඉහළවත්තට යන මාර්ගයේ හොරගස්තුන අසළ දොළ හරහා පාලම ඉදි කිරීම
III. දිප්පිටිගල - පොල්තැන්න මාර්ගයේ එගොඩවත්ත දොළ හරහා ටී.කේ.පියදාස මහතාගේ නිවස අසළ පාලමක් ඉදි කිරීම
IV. දිප්පිටිගල - එගොඩවත්ත දොළ හරහා පත්මසිරි මහතාගේ නිවස අසළ පාලමක් ඉදි කිරීම.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 12</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංවර්ධනය කිරීමට නියමිත ඉහත සඳහන් ග්‍රාමීය පාලම් සංවර්ධනය කිරීම සඳහා එකඟතාවය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>II.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමාගේ යෝජනා</u>**

13.ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකුගේ හෝ මන්ත්‍රීවරියකගේ හා ප්‍රාදේශීය සභා කාර්යය මණ්ඩලයේ ළඟම ඥාතිවරයෙකුගේ අවමංගල්‍ය කටයුත්තකදී සභාවේ වැඩි අවධානයක් යොමු කර සහයෝගය දීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 13</u>**

මේ සම්බන්ධයෙන් තීරණයකට එළඹුනේ නැත.

**<u>III.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ටී.ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමියගේ යෝජනා.</u>**

14. පල්ලෙගම්ගොඩ මාර්ගයෙන් වන්නිආරච්චිගම දක්වා මාර්ගය බැකෝ කර සකස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 14</u>**

පවතින ඉන්ධන ගැටළුව යථා තත්වයට පත් වූ පසු ප්‍රමුඛතාගත පිළිවෙළට පොදු වැඩ සඳහා බැකෝ යන්ත්‍රය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

15.වන්නිආරච්චිගම සිට ඊරියන්දළුව මාර්ගය හල්ලින්න වත්ත අසළින් බැකෝ කර සකස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 15</u>**

පවතින ඉන්ධන ගැටළුව යථා තත්වයට පත් වූ පසු ප්‍රමුඛතාගත පිළිවෙළට පොදු වැඩ සඳහා බැකෝ යන්ත්‍රය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

16.වන්නිආරච්චිගම සිට බටලන්ද මාර්ගය 1KM පමණ සකස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.රුවන් වානක පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 16**

පවතින ඉන්ධන ගැටළුව යථා තත්වයට පත් වූ පසු ප්‍රමුඛතාගත පිළිවෙළට පොදු වැඩ සඳහා බැකෝ යන්ත්‍රය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

17.වන්නිආරච්චිගම නො.05 නිවස අසළ සිට ඉහළ මධුර මහතාගේ නිවස දක්වා මාර්ගය බැකෝ කර සකස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.රුවන් වානක පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 17**

පවතින ඉන්ධන ගැටළුව යථා තත්වයට පත් වූ පසු ප්‍රමුඛතාගත පිළිවෙළට පොදු වැඩ සඳහා බැකෝ යන්ත්‍රය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

18.බොරාල මාර්ගයෙන් නාකැල්ල දක්වා මාර්ගය බැකෝ කර සකස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.රුවන් වානක පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 18**

පවතින ඉන්ධන ගැටළුව යථා තත්වයට පත් වූ පසු ප්‍රමුඛතාගත පිළිවෙළට පොදු වැඩ සඳහා බැකෝ යන්ත්‍රය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

19.බණ්ඩාරනායකපුර මාර්ගයේ මීටර් 100ක් පමණ බැකෝ කර සකස් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.රුවන් වානක පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 19**

පවතින ඉන්ධන ගැටළුව යථා තත්වයට පත් වූ පසු ප්‍රමුඛතාගත පිළිවෙළට පොදු වැඩ සඳහා බැකෝ යන්ත්‍රය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

20.බණ්ඩාරනායකපුර ප්‍රධාන මාර්ගයේ තැනින් තැන ගමන් කිරීමට නොහැකි ස්ථාන බැකෝකර සකස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.රුවන් වානක පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 20**

පවතින ඉන්ධන ගැටළුව යථා තත්වයට පත් වූ පසු ප්‍රමුඛතාගත පිළිවෙළට පොදු වැඩ සඳහා බැකෝ යන්ත්‍රය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**IV.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.රුවන් වානක පියරත්න මැතිතුමාගේ යෝජනා.**

21.අංක 180/ඒ නිරල්ගම ග්‍රාමසේවා වසමෙහි පිහිටි ජාතික වතු සංවර්ධන මණ්ඩලයට අයත් පරකැටිය වත්ත,පරකැටිය යන ගමෙහි පිහිටි පොදු ක්‍රීඩා පිටිය පිහිටා ඇත්තේ වතු සංවර්ධන මණ්ඩලයට අයත් කොටසේ බැවින් වර්ථමානය වන විට එම වතු කොටස් බදු පදනම මත පුද්ගලික වැවිළිකරුවන් වෙත ලබා දී ඇති හෙයින් වසර 50 වඩා පැරණි ක්‍රීඩා පිටිය අහිමි වීමේ කණගාටුදායක තත්වයක් මේ වන විට නිර්මාණය වී ඇති හෙයින් මෙම අවධානමෙන් ගලවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටිමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 21**

අංක 180/ඒ නිරල්ගම ග්‍රාමසේවා වසමෙහි පිහිටි ජාතික වතු සංවර්ධන මණ්ඩලයට අයත් පරකැටිය වත්ත,පරකැටිය යන ගමෙහි පිහිටි පොදු ක්‍රීඩා පිටිය පිහිටා ඇත්තේ වතු සංවර්ධන මණ්ඩලයට අයත් කොටසේ බැවින් වර්ථමානය වන විට එම වතු කොටස් බදු පදනම මත පුද්ගලික වැවිළිකරුවන් වෙත ලබා දී ඇති හෙයින් වසර 50 වඩා පැරණි ක්‍රීඩා පිටිය අහිමි වීමේ කණගාටුදායක තත්වයක් මේ වන විට නිර්මාණය වී ඇති හෙයින් මෙම අවධානමෙන් ගලවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටින යෝජනාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**V.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමාගේ යෝජනා.**

22.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල මණ්ඩලය යටතේ ,බොහෝ පිරිස් තම ජීවිකාව ගෙන යාමට ආධාරකයක් කරගෙන ඇත්තේ පතල් කාර්මාන්තයයි.වේ ගහ ඇසුරු කර ගනිමින් මෙම කර්මාන්තයේ නියැලෙන බහුතර පිරිසක් වර්තමානයේ පවතින නීතිමය තත්වය අනුව පත්ව ඇත්තේ දැඩි දුෂ්කරතාවයකටය.අලුත් අවුරුදු සමය ආසන්නව පැවතීමත් විය හියදම් අධිකව ක්‍රියාත්මක වන කාලයක් බැවින් මොවුන්ට පතල් කර්මාන්තයේ නියැළීමට මෙම කාළය තුළ යම් සහනයක් පැවතුනහොත් එය ඉතා විටිනා දෙයකි.එබැවින් පවතින රජයත් දැනුවත් කොට මොවුන්ට මේ සම්බන්ධව යම් සහනයක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඉන්දික උදය කුමාර ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 22**

මේ සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කමිටුවෙහි දීර්ඝ ලෙස සාකච්ඡා වී තීන්දු තීරණ ලබා ගෙන ක්‍රියාත්මක වන බව ගරු සභාවට දන්වන ලදි

**VI.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි වෙරංජා කාමනී විජේරත්න මැතිතුමියගේ යෝජනා.**

23.රිල්හේන මිතුරෝ මාර්ගයේ වීදි ලාම්පු 10ක පමණ බල්බ් ප්‍රමාණයක් ලබා දෙන ලෙසට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 23**

ඉදිරියේදී වීදි පහන් ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

24.පැල්මඩුල්ල රිල්හේන වසමේ ග්‍රාම සංවර්ධන නිළධාරීතුමියට,සංවර්ධන නිලධාරීතුමියට, සමෘද්ධි සංවර්ධන නිලධාරීතුමියට කාර්යාලයක් දැමීමට ස්ථානයක් නොමැති හෙයින් ප්‍රජා ශාළාවක් ඉදිකිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම බහු කාර්යය ගොඩනැගිලි ඉදිකිරීමේදී ඉඩකඩක් පවතී නම් සමෘද්ධි සමිති වල පවතින මුදල් පොදු කටයුත්තක් සඳහා පමණක් ලබා ගත හැකි බවත්,මෙම මුදල් ලබා ගෙන කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමක් සිදු කිරීමට හැකියාවක් පවතින බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ටී.ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය පවසන ලදි.

**තීරණ අංක 24**

පැල්මඩුල්ල සමස්ථ බල ප්‍රදේශයේම බහුකාර්යය ගොඩනැගිලි වල අවශ්‍යතාවයන් හදුනාගෙන ඇති බවත්,දැනට රජය විසින් තිබෙන අර්ධ වශයෙන් ප්‍රතිසංස්කරණය කළ යුතු බහුකාර්යය ගොඩනැගිලි හදාගෙන යන බවත්,අලුතින් බහුකාර්යය ගොඩනැගිලි මෙම වර්ෂයේ බහුකාර්යය ගොඩනැගිලි ඉදිනොවන බවත්,ලබන වර්ෂයේදී බහුකාර්යය ගොඩනැගිලි සඳහා රජය මඟින් මුදල් වෙන් වන බවත් ගරු සභාවට දන්වන ලදි.

**VII.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මිත දීපාල් මැතිතුමාගේ යෝජනා.**

25.මාරපන දකුණ විජිත උක්වත්ත මහතාගේ නිවස අසළින් කහවිටියාගොඩට යන පාර බැවුම් සහිත බැවින් යකඩ පයිප්ප දමා වැටක් සකස් කර දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.චන්ද්‍රලාල් ජයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 25**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු ලැබෙන නිර්දේශ අනුව මේ සම්බන්ධයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමේ හැකියාවක් පවතීද යන්න සොයා බැලීමක් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති නම් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

**VIII.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමාගේ යෝජනා.**

26.පැල්මඩුල්ල පොළෙහි වැසිකිළිය අවුරුදු දින වලට භාවිතයට සුදුසු ලෙස ප්‍රතිසංස්කරණය කර, සහා සේවකයෙකු යොදවා එය භාවිතා කරන්නන්ගෙන් ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 26**

පැල්මඩුල්ල පොළෙහි වැසිකිළිය අවුරුදු දින වලට භාවිතයට සුදුසු ලෙස ප්‍රතිසංස්කරණය කර, සහා සේවකයෙකු යොදවා එය භාවිතා කරන්නන්ගෙන් ගාස්තු අය කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

27.කසළ අංගනයේ වහළේ දිරාගොස් ඇති කොටස ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 27**

කසළ අංගනයේ වහළේ දිරාගොස් ඇති කොටස ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

සති පොළ ළඟ ඇති වැසිකිළිය ප්‍රතිසංස්කරණය කිරීම වඩාත් හොඳ යෝජනාවක් බවත්,අවුරුදු සමයේ ප්‍රචාරක කටයුතු සඳහා ගිය වර සභාවේදී ටෙන්ඩර් කිරීම සුදුසු බව පැවසුවත් එය වෙළඳ සංගමයට ලබා දීම නිසා හා වෙළඳ සංගමය එය ලබා නොගැනීම නිසා ආදායමක් සභාවට අහිමි වූ බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසන ලදි.

ටෙන්ඩර් කිරීම සාධාරණ බවත්, නමුත් වෙළඳ සංගමයට දෙමු යනුවෙන් ප්‍රකාශ කළ බවත්,එයට හේතුව ලෙස වෙළඳ සංගමය නිතරම සභාවට අතහිත දෙන නිසා බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

ටෙන්ඩරයකට නොයා වෙළඳ සංගමයට දීමට තීරණය කරනු ලැබුවේ වෙළඳ සංගමය හා සභාව අතර අන්‍යෝන්‍යය සම්බන්ධතාවය තවත් තහවුරු කර ගැනීමට බවත් ඔවුන් එම විශ්වාසය කඩ කළ බවත්,එයින් සභාවට ලැබෙන්න තිබුණ ආදායම අහිමි වූ බවත්,මෙය පාඩමකට අරගෙන ඉදිරියේදී ටෙන්ඩරයකට යාම සුදුසු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා පවසන ලදි.

**IX.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමාගේ යෝජනා.**

28.මොරතොට "නිමල් රණවිරු"මාවතේ පිහිටි මාර්ගයට හානිදායකව ඇති බෝගස ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 28**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව , මෙම බෝ ගස සභා මාර්ගයක පොදු ජනයාට හා මාර්ගයට අනතුරු දායක තත්වයක් ඇත්නම් සභා වියදමෙන් මෙම බෝගස ඉවත් කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

කමිටුවක් ලෙස ස්ථානීය පරීක්ෂණයක් සිදු කර සති පොළ වැසිකිළිය ටෙන්ඩර් කිරීමට හා බෝඩ් එකක් ගැසීමට නිර්දේශ ලබා දුන්නත් එය ක්‍රියාත්මක වූයේ නැත.තවද මෙම 13 වන යෝජනාව සම්බන්ධයෙන් එකඟතාවයක් නොවන බව පෞද්ගලික අදහස බවත්,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා පවසන ලදි.

මෙම 13 වන යෝජනාව සභාවේ පිරිස නිහඩව ඉදල හෝ සම්මත වෙයි කියා හිතුවේ නැති බවත්,මෙවැනි යෝජනාවක් සභාවක අනුමත

නොවිය යුතුය.මන්ද අප ඇවිත් තිබෙන්නේ මහජනතාවට සේවය කිරීමට බවත්,සාමාන්‍ය ජනතාවට නැති වරප්‍රසාදයක් ලබා ගැනීම පැමිණියේ නැති බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා පවසන ලදි.

මෙම යෝජනාවෙන් මන්ත්‍රීවරුන්ට හා නිළධාරීන්ට ආයතනික සුහසාධනයක් සිදු කිරීම මෙම යෝජනාවෙන් අදහස් කළ බවත්,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසන ලදි

ප.ව.12.00ට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ටී. ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ආර්.පුවනේෂ්වරී මැතිතුමිය සභාවෙන් පිටවන ලදි.

අප ගමේ ජනතාවගේ ඡන්දයෙන් ප්‍රාදේශීය සභාවට තේරී පත්වුණු අතර,සංවර්ධන යෝජනාවකදී මොන ආණ්ඩුවකින් කළත් අපි උදව් වී තිබෙනවා.ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට රු.15,000.00ක දීමනාවට එවකට හිටපු උප සභාපති තුමන් කතා කර රු.8000.00ක මුදලක් දීමනාවට එකතු කර ලබා දීමට කටයුතු කර තිබූ බවත්, මන්ත්‍රී වරුන්ට ඉන්ධන දීමනාව,දුරකථන දීමනාව ලබා දෙන ලෙසත්,අඩුම වශයෙන් දුරකථන දීමනාව රු 1500.00ක්වත් ලබා දීම වටින බවත්,ඉන්ධන දීමනාව ලෙස විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට වැඩපිළිවෙළක් සකස් කරන ලෙසත්,ආණ්ඩුකාරතුමිය හමුවීමට වුවත් පැමිණිය හැකි බවත්,මෙය විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට සළසා දෙන ලෙසත් මෙය අපගේ වරප්‍රසාදයක් බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසන ලදි.

ආපදා සමයකදී ඔරු වල අවශ්‍යතාවයක් පැන නැගුණු බවත්,සමිතිවල ඇති හා ස්වේච්ඡා සංවිධාන වලින් ලබා දුන් ඔරු හඳුනාගෙන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට , ප්‍රාදේශිය සභාවට හෝ පොලීසියට ඒවා පවරා ගැනීම මඟින් අත්‍යවශය මොහොතක අපිට ඒවා භාවිතයට ගත හැකි බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා පවසන ලදි.

පුද්ගලයන් භාරයේ ඇති ඔරු පිළිබඳ විස්තර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලේඛනගතව ඇති බවත්,එම විස්තර ලබාගෙන එම ඔරු නිසිතැන් වලට ලබා දෙන්නේ නම් මෙම වැඩපිළිවෙළ සාර්ථක බවත්,වේ ගඟ හරහා හෝ කළු ගඟ හරහා ඔරු පදින්න හැකියාව ඇති පුද්ගලයන් නොමැති ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලේඛනගතව ඇති බවත්, වීම ප්‍රධාන ගැටළුව බවත්,මේ සඳහා නිසි සැලැස්මක් සැකසිය යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඉන්දික උදය කුමාර ගුණවර්ධන මැතිතුමා පවසන ලදි.

**07.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.**

2026.03.23 පැවති කාර්මික හා සේවා කමිටු රැස්වීම් වාර්තාව සභාගත කරන ලදි.

කාර්මික සේවා කමිටුවේ ප්‍රගති සමාලෝචන රැස්වීමක් ඉදිරියේදී පවත්වන බව ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

**08.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළයුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.**

2026.02.01 සිට 2026.02.28 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව සභා ගත කරන ලදි.

**වෙනත් කරුණු**

- **සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම**.

*ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් ලියනගේ මැතිතුමා*

ප්‍රාදේශිය සභාවට අයත් ටෙන්ඩර් පදනම මත නිකුත් කල කඩ කාමර වල සිටින වෙළඳුන් ඔවුන්ගේ ටෙන්ඩර් කාල සීමාව වසරක් වන හෙයින් එය ඔවුන්ගේ ව්‍යාපාරය සාර්ථක ලෙස කරගෙන යාමට ප්‍රමාණවත් කාළයක් නොවන බැවින් එය තවත් ඉදිරියට දීර්ඝ කර දෙන මෙන් ඉල්ලා සිටිමි.මේ ගැන අවධානය යොමු කර දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

*ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා*

මාරපන ප්‍රාදේශය ගංවතුර ආපදා වලට ලක්වූ අවස්ථාවේදී රජයන් විසින් ලබාදුන් ඔරු පුද්ගල පරිහරණය සඳහා භාවිතා කරන බවත්, ආපදාවට ලක්වූ ප්‍රදේශයන්හී පුද්ගල අවශ්‍යතාවයන් ඉටු කිරීමට(ආහාර ජලය ලබා දීම හා ආරක්ෂිත ස්ථානකරා ගෙන යාම )අවශ්‍ය ඔරු ලබා දීමෙන් වැළකී සිටින නිසා එම අවශ්‍යතාවය නියමිත වේලාවට කරගැනීමේ අපහසුතාවයක් ඇති විය.ලබා දී ඇති ඔරු අගුල් ආපදා අවස්ථාවේදී ලබා ගැනීමට විශාළ පරිශ්‍රමයක් දැරීමට සිදු වන බැවින් ඒ සඳහා අවශ්‍යය නීතිමය හෝ එකඟතාවයක් ඇති කරගැනීම සුදුසුය.

- **සභාපතිතුමාගේ ස්තුති කිරීම.**

අද දින සභාවට පැමිණ සිටින ගරු විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී.

- ප.ව.12.20 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.

ගරු ප්‍රාදේශීය සභා .................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ....................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2026-05-13 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව